**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ (අතිරේක මූල්‍යකරණය) ව්‍යාපෘතිය - 2020**

---

**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ (අතිරේක මූල්‍යකරණය) ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2016 සැප්තැම්බර් 05 දින එළඹි අංක 5768- එල්කේ දරන මූල්‍ය ගිවිසුමෙහි I වන කොටසේ සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය සහ ප්‍රදාන සඳහා වූ සාමාන්‍ය කොන්දේසිවල 4:09(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

**ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඌව පළාත්බද මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු වූයේ දේශගුණික අවදානම්වලට නිරාවර්තිත ජනයා හා වත්කම් ගොදුරුවීම් සඳහා නතුවීමට ඇති අවකාශය අවම කිරීම හා ආපදාවන්ට සඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා ලබන්නන්ගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම යි. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු වියදම රුපියල් මිලියන 6,048 කට සමාන ඇමෙරිකන් එක්සත් ජනපද ඩොලර් මිලියන 42 ක් වන අතර මුළු මුදලම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟවිණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ඔක්තෝම්බර් 15 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි.**

**1.3 මතය**

---

**ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

---

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු/ විගණන නිරීක්ෂණය | වටිනාකම රු.මි. | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 24 ඡේදය අනුව, වාර්තාකරණ කාලපරිච්ඡේදයට අදාළව අයවැය සමඟ මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය කළ | 1,983.62 | ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති සංරචක මත පදනම්ව අයවැය ඇස්තමේන්තු පිළියෙළ කරයි. 2014 | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | සංඛ්‍යා සැසැඳීම් වෙන වෙනම හෙළිදරව් කළ යුතුය. කෙසේනමුත් එම අවශ්‍යතාවලට අනුගත නොවී තිබුණි. | | අගෝස්තුවල ව්‍යාපෘති ආරම්භයේ සිට මෙම පිළිවෙත අනුගමනය කරන ලද අතර මෙය ලෝක බැංකුව ඇතුළුව අදාළ බලධාරීන් විසින් පිළිගෙන ඇත. ඒ අනුව ඇස්තමේන්තු සහ සත්‍ය වියදම් ඇතුළත් සංසන්දනාත්මක වාර්තාවක් අමුණා ඇත. | |
| 02 | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 18 ඡේදය අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශන මෙහෙයුම්, ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ඡේද 21 සිට 32 දක්වා නිර්වචනය කර ඇති පරිදි මෙහෙයුම්, ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස වර්ගීකරණය කිරීම හා වාර්තා කිරීම කළ යුතුය. වර්ගීකරණය පදනම මත පහත හඳුනාගැනීම් සමඟ ඉහත මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශන අනුකූල නොවුණි.<br>සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති කටයුතු සඳහා ශ්‍රී ලංකා රජයේ අරමුදලින් රුපියල් 3,000,000 ක් හා ලෝක බැංකු සහයෝගයෙන් රුපියල් 1,525,040,601 ක් වැයකර තිබුණි. ඉහත වියදමින් විශාල ප්‍රතිශතයක් ව්‍යාපෘතියේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වැය කර තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි ඉහත සඳහන් කර ඇති නිර්නායකවලට අනුකූලව වියදම් ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී, මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වියදම් කළ මුදල් එම වියදම්වල වෙන වෙනම හඳුනාගෙන නොතිබුණි. ඉහත අනුව, රුපියල් 156,087,461 ක් ආයෝජන ක්‍රියාකාරකම් ලෙස හඳුනාගෙන | 1528.04 | විමසුම අනුව, රුපියල් 3,000,000 ක් දේශීය අරමුදලින් හා රුපියල් 1,525,046,601 ක් විදේශීය අරමුදලින් දරා තිබුණි. ව්‍යාපෘතිය ආරම්භයේ සිට විගණනය වෙත ඉදිරිපත් කළ ආකෘතියම 2020 වර්ෂයේත් ඉදිරිපත් කරන ලදී. අවශ්‍ය සංශෝධන ව්‍යාපෘතියේ ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබූ අතර ඉතිරි රුපියල් **1,525,135,735** මුළු ආයෝජන ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම්වල හඳුනාගෙන තිබුණි. | | | |
| 03 | අත්තිකාරම් ගිණුම් ශේෂය ප්‍රවර්තන වර්ෂය තුළ රුපියල් **143,865,494**කින් අඩුවී තිබූ අතර වෙනත් ශේෂවල ඉතිරිය රුපියල් **12,317,101**කින් ප්‍රවර්තන වර්ෂය තුළ අඩුවී තිබුණි. ප්‍රමිතයේ නිර්ණායකවලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරිමේදී, ආයෝජන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් හඳුනානොගෙන ගැලපීම් සම්පූර්ණයෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට සිදුකර තිබුණි. | **12.46** | අත්තිකාරම් ගිණුම් සහ වෙනත් ගෙවුම් ශේෂයන් ව්‍යාපෘතිය විසින් විගණනයට පෙර වර්ෂවල ඉදිරිපත් කළ පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනවල ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කර තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |
| 04 | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක **02** හි **31** ඡේදය අනුව, ශ්‍රී ලංකා රජය විසින් ප්‍රවර්ථන වර්ෂයේදී රජයේ අරමුලින් දරන ලද රුපියල් මිලියන **3**ක මුදල මූල්‍ය ක්‍රියාකාරකම් මගින් ජනිත වූ මුදල් ප්‍රවාහවල වෙනම හඳුනාගෙන නොතිබුණි. | **3** | ඉදිරියේ එන මුදල් ප්‍රවාහ ප්‍රකාශනවල දේශීය අරමුදලින් දරන ලද වියදම් වෙන් කිරීම සඳහා වැඩපිළිවෙළක් ඇති කරන ලදී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |
| 05 | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක **02** හි **59, 60, 61, 62** ඡේද යටතේ වෙනත් හෙළිදරව් කිරීමක් සිදු නොකර ඇතිහෙයින්, අදාළ මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රමිතයේ සඳහන් මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවලට අනුකූලව නොතිබුණි. | | ව්‍යාපෘතිය විසින් ඉදිරි විගණන වෙත ඉදිරිපත් කරන මුදල් ප්‍රවාහ ප්‍රකාශනවල විගණනය පෙන්වා දුන් ගැලපීම් ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 කොන්ත්‍රාත් කළමනාකරණය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 01 | මන්නාරම යෝධ වැවේ පිටවානෙහි වම් ඉවුරු ඇල බැම්මේ දෙපස පිඩලි ඇල්ලීම සඳහා රුපියල් **4,544,430**ක | මන්නාරම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැන්වූ පරිදි **2017** මාර්තු කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති අතර **2018** මාර්තු | අදාළ පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුදලක් ගෙවා තිබුණද, බැම්මේ මතුපිට මීටර් 04ක පළලින් යුතු විය වුවත්, බැම්මේ මතුපිට විවිධ පළලින් යුතුව ඉදිකර ඇති බව නිරීක්ෂණය විය. ඉදිකිරීම නියමිත ප්‍රමිතියට නොවීම නිසා හානිවීමේ අවකාශයක් පවතී. | නිමකර තිබුණි. ඒ අනුව අද වනවිට මෙම වැඩය වසර 03කට පෙරාතුව නිමකර තිබුණි. මන්නාරම් දිස්ත්‍රික්කය අතිශයින්ම වියළි බව පැහැදිලි කරුණක් වන අතර මෙම කලාපයේ පවතින දැඩි නියඟය හේතුවෙන් තණ පිඩළි වියැළෙයි. මෙම ප්‍රදේශයේ දේශීය ප්‍රජාවගේ ප්‍රධාන ජීවනෝපාය ගවපට්ටි සහ එළුවන් ගොවිපොල පවත්වාගෙන යාම හා ධීවර කටයුතුය. එබැවින් මෙම තත්ත්වය යටතේ වැව් බැම්ම පාරේ ගවපට්ටි හා එළුවන් ගමන් කිරීම වැළැක්විය නොහැකිය. එමනිසා, වැව් බැම්ම පාර ස්වභාවයෙන්ම බාදනයට ලක්වන අතර මෙම ස්වභාවය දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු විසින් පිළිගෙන තිබුණි. එසේම දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු දැන්වූ ආකාරයට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් හා නඩත්තු ප්‍රතිපාදන යටතේ වැව් බැම්ම පාරේ මෙම බාදිත ස්ථාන වාර්ෂිකව නඩත්තු කරනු ලබයි. | |
| 02 | මන්නාරම වෙල්ලකඩ්ඩු වැව් බැම්ම සඳහා අවශ්‍ය පස් වැව් බැම්මේ කිලෝමීටර් 1.2ක් දුරින් ප්‍රවාහනය කිරීමට මිල ගණන් දන්වා තිබුණි. නමුත් වැව් බැම්ම සඳහා යොදාගෙන තිබූ පස් වැව් පතුලින් ලබාගෙන තිබුණි. එලෙසම, රුපියල් 659,214ක වටිනාකමැති වැඩ අයිතම අංක 6.4 ඉටුකර නොතිබුණි. | මන්නාරම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැන්වූ පරිදි වැව් බැම්ම පිරවීම සඳහා සුදුසු පස් ඉංජිනේරු රසායනාගාරයෙන් පරීක්ෂා කිරීමෙන් පසුව වැව්පතුලෙන් තෝරා ගැනුණි. වැව් පතුලේ සිටද ප්‍රවාහන දුර පිළිගත හැකිය. එසේම රුපියල් 659,214ක වටිනාකමැති වැඩ අයිතම අංක 6.4 වැව්බැම්මේ දෙපස පැතිවල තණ පිඩලි ඇතිරීම සඳහා වෙන් කෙරුණි. මෙම අයිතමය කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ කර ඇතිමුත් තණපිඩලි නඩත්තුව (වතුර දැමීම) නිසිපරිදි කොන්ත්‍රාත් කාලසීමාව තුළ සිදුකර නොතිබුණු අතර තණ | වැඩ නිසි පරිදි අවසන් කිරීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් දීම අවශ්‍යය. |

| | | | |
|---|---|---|---|
| | | පිඩැලි වියළී තිබුණි. මෙම තත්ත්වය යටතේ මෙම අයිතමය සඳහා ගෙවිය යුතු මුදල ගෙවනු නොලැබිය. | |
| 03 | රාජාංගනය ගැමි ඉසුරු ගොවි සංවිධානය සඳහා 2018 වර්ෂයේදී රුපියල් 7,254,730ක් ජල සැපයුම් පද්ධතියක්, රුපියල් 1,260,033ක් වගා ජල ටැංකි සඳහා සහ රුපියල් 4,962,931ක් ඇල පද්ධතියක් ඉදිකිරීම සඳහා ද වැය කර තිබුණි. කෙසේනමුත්, 2021 වනවිටත් වගා ජල ටැංකි සහ ජල සැපයුම් ව්‍යාපෘතිය කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් යොදාගෙන නොතිබුණි. | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයාට අනුව, මේ වනවිට ගොවි සංවිධානය විසින් වියළි දිනවල වගා කටයුතු සඳහා අවශ්‍ය ජලය ලබාගැනීම සඳහා උස්සාන ජල යෝජනා ක්‍රමය ප්‍රයෝජනයට ගනු ලබයි. කෙසේවුවද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නිලධාරීන් කණ්ඩායමක් යැවීමට තීරණය කර ඇති අතර ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් අනතුරුව වර්තමාන තත්ත්වය දන්වනු ලැබේ. | වැඩ නිසි පරිදි අවසන් කිරීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් දීම අවශ්‍යය. |
| 04 | මොනරාවන වම් ඇල බැම්ම මත වූ පාරේ මීටර් 1000ක් දිගින් යුත් කොටස පස් පුරවා බොරළු අතුරා පිඩලි ඇල්ලීම වෙනුවෙන්, රු.3,702,786 ක මුදලක් වැය කර තිබුණි. කෙසේවුවත්, පාරේ මීටර් 834 ක් පමණක් සංවර්ධනය කර තිබූ අතර සංවර්ධනය නොකරන ලද මීටර් 166ක් සඳහා රුපියල් 614,662ක් වැඩිපුර ගෙවා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අදාල පාර්ශවයන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| 05 | මොනරාවන අමුණේ වම් සහ දකුණු ඇළ මාර්ග යළි ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී, අතින් අත්තිවාරම් කැපීම සඳහා ඝන මීටර් එකක් රුපියල් 1281 බැගින් ඝන මීටර් 147.38 ක් වෙනුවෙන් ඇස්තමේන්තු සකස් කර තිබුණද, ජේසීබී යන්ත්‍රයක් මාර්ගයෙන් ඝන මීටර් එකක් රුපියල් 148.58 බැගින් අත්තිවාරම් කැපීම හේතුවෙන් වැඩිපුර රු.167,191ක් ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අදාළ පාර්ශවයන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| 06 | මොනරාවන දකුණු ඇල යළි ඉදිකිරීමේදී, මීටර් 225ක ඇලේ ගල් කැඩීම සඳහා රුපියල් 3,168.66ක අත් රේටයකට ඇස්තමේන්තු පිළියෙළ කර තිබුණද, මීටර් 119.18ක ගල් කැඩීම සඳහා රුපියල් 1,468.88ක යන්ත්‍ර රේටයක් යොදාගෙන තිබුණි. ඒ් අනුව, රුපියල් 202,579ක අධි ඇස්තමේන්තුවක් සහ අධි ගෙවීමක් පවතී. | පිළිතුරු ලබා දී නොමැත. | අදාළ පාර්ශවයන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| 07 | ඝන මීටරයකට රුපියල් 2,450 බැගින් ඝන මීටර් 1,639.125ක බොරළු ඇතිරීම සඳහා සහ 5511 දිගට සද්ධාතිස්ස වැවේ දකුණු ඉවුර ඇළ බැම්ම යළි ඉදිකිරීම් සඳහා රුපියල් 4,015,856ක් ගෙවා තිබුණි. පාරේ ස්ථාන 10ක මීටර් 148.8ක බොරළු අතුරා නොතිබුණු අතර රුපියල් 108,430ක් නිම නොකරන ලද වැඩ සඳහා ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වැඩ විධිමත්ව අවසන් කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබා දිය යුතුය. |
| 08 | සද්ධාතිස්ස වැවේ දකුණු ඉවුරු ඇල බැම්ම ඉදිකරන කාලසීමාව තුළ ජලය සහ වගාකිරීම් නතර කර තිබුණද, ඇලේ යළි ඉදිකිරීම් කාලසීමාව තුළ ජලය ඉවත් වෙනුවෙන් පැය 2,216.47ක් සඳහා රුපියල් 842,258 ක් ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අදාළ පාර්ශවයන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගත යුතුය. |

3.2 ව්‍යාපෘති අරමුණුවලට පරිබාහිර සිදු කළ ක්‍රියාකාරකම්/ ගෙවීම්

---

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ------ | ------------------------ | ------------------------------ | ------------ |
| 01 | ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් රුපියල් මිලියන 4,075.95ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ 109 ක් පිරිනමා තිබූ අතර ඉන් රු.1,187.50 ක් වටිනා | විගණන විමසුමේ සඳහන් කළ පරිදි, නිශ්චිත කොන්ත්‍රාත් කාලසීමාව තුළ නිම නොකරන ලද රුපියල් මිලියන 1,187.50 ක වටිනාකමැති කොන්ත්‍රාත් පැකේජ 25ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් | වැඩ සැලැස්ම අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිම කිරීමට කටයුතු කළ යුතුය. ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කිරීමට නිර්දේශ |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත් පැකේජ 25ක් කොන්ත්‍රාත් කාලසීමාව හා පොරොත්තු කාලසීමාව තුළ සම්පූර්ණ කර නොතිබුණි. මෙම කොන්ත්‍රාත් පැකේජ ප්‍රමාදවීම් මාස 03 සිට මාස 24ක කාල පරාසයක පැවතුණි. | දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ අරමුදල් යටතේ පිරිනමා තිබූ බව නිරීක්ෂණය විය. එසේම මෙම පැකේජවල ප්‍රමාදයන් මාස 03 සිට 24 දක්වා කාලපරාසයක පැවතුණි. මෙම පැකේජ නියමිත කාලසීමාව තුළ නිම නොකිරීමේ තත්ත්වයක් ඇතිවූයේ අනපේක්ෂිත කාලගුණික තත්ත්වන්, යකඩ වැනි ඉදිකිරීම් අමුද්‍රව්‍ය වෙළඳපොළ තුළ නොපැවතීම, වේලාවට පස් හා බොරළු බලපත්‍ර ලබා ගැනීමේ අපහසුතා, පවතින කොවිඩ්-19 ව්‍යසන තත්ත්වය යටතේ පනවන ලද සංචරන සීමා හා රට වසාදැමීම් හේතුවෙන් කාලීනව ශ්‍රමය ලබා ගැනීමේ අපහසුතා හේතුවෙනි. මෙම කොවිඩ්-19 වසංගතය නිසා ලෝක බැංකුව සහ ශ්‍රී ලංකා රජය විසින් ව්‍යාපෘතිය සඳහා දින දීර්ඝ කිරීම් ලබා දුනි. කෙසේවුවද, මේ සයළු කොන්ත්‍රාත් සඳහා කාල දිගු අවශ්‍යතා මත ලබා දුන් අතර දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීම් නිම කිරීමේ දිනය වන 2021 අප්‍රේල් 30 දින වන විට සියළු කොන්ත්‍රාත් පැකේජ සම්පූර්ණයෙන්ම නිම කර තිබුණි. | කිරීමට පෙරාතුව ප්‍රමාදවීම් සඳහා හේතු හදුනා ගැනීම කළ යුතුය. |
| 02 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට රුපියල් මිලියන 1,083.2ක් වටිනාකමැති කොන්ත්‍රාත් පැකේජ 27ක් පිරිනමා තිබුණි. මේ අතුරින් රුපියල් මිලියන 192.8ක් වටිනාකමැති කොන්තාත් පැකේජ 04ක් කොන්ත්‍රාත් කාලසීමාව තුළ නිම කර නොතිබුණි. මෙම කොන්ත්‍රාත් පැකේජවල ප්‍රමාදවීම් මාස 08 සිට 32 දක්වා කාල පරාසයක පැවතුණි. | දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍යයනය යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට පිරිනමා තිබූ රුපියල් මිලියන 192.8ක් වටිනාකමැති කොන්ත්‍රාත් පැකේජ 04 කොන්ත්‍රාත් කාලසීමාව තුළ නිම කර නොතිබුණි. මෙම පැකේජ නිම කිරීමේ ප්‍රමාද කාලය මාස 08 සිට 32 දක්වා කාල පරාසයක පැවතුණි. මෙම පැකේජ නියමිත කාලසීමාව තුළ නිම නොකිරීමේ තත්ත්වයක් ඇතිවූයේ අනපේක්ෂිත කාලගුණික | වැඩ සැලැස්ම අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිම කිරීමට කටයුතු කළ යුතුය. ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කිරීමට නිර්දේශ කිරීමට පෙරාතුව ප්‍රමාදවීම් සඳහා හේතු හදුනා ගැනීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තත්ත්වන්, යකඩ වැනි ඉදිකිරීම් අමුද්‍රව්‍ය වෙළඳපොළ තුළ නොපැවතීම, වේලාවට පස් හා බොරළු බලපත්‍ර ලබා ගැනීමේ අපහසුතා, පවතින කොවිඩ්-19 ව්‍යසන තත්ත්වය යටතේ පනවන ලද සංචරන සීමා හා රට වසාදැමීම් හේතුවෙන් කාලීනව ශ්‍රමය ලබා ගැනීමේ අපහසුතා හේතුවෙනි. මෙම කොවිඩ්-19 වසංගතය නිසා ලෝක බැංකුව සහ ශ්‍රී ලංකා රජය විසින් ව්‍යාපෘතිය සඳහා ද දීර්ඝ කිරීම් ලබා දුනි. කෙසේවුවද, මේ සියළු කොන්ත්‍රාත් සඳහා කාල දිගු අවශ්‍යතා මත ලබා දුන් අතර දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීම් නිම කිරීමේ දිනය වන 2021 අප්‍රේල් 30 දින වන විට සියළු කොන්ත්‍රාත් පැකේජ සම්පූර්ණයෙන්ම නිම කර තිබුණි. | |
| 03 | ඌව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට රුපියල් මිලියන 1,931.75ක් වටිනාකමැති කොන්ත්‍රාත් පැකේජ 17ක් පිරිනමා තිබුණි. මේ අතුරින් රුපියල් මිලියන 1,012.5ක් වටිනාකමැති කොන්තාත් පැකේජ 08ක් කොන්ත්‍රාත් කාලසීමාව තුළ නිම කර නොතිබුණි. | ඌව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පිරිනමා තිබූ රුපියල් මිලියන 1,012.5ක් වටිනාකමැති කොන්ත්‍රාත් පැකේජ 08 කොන්ත්‍රාත් කාලසීමාව තුළ නිම කර නොතිබූ බව සඳහන් වේ. කොවිඩ්-19 බලපෑම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ශ්‍රම බලකාය සොයා ගැනීමට නොහැකි වී ඇත. මෙය ප්‍රමාදයට ප්‍රධාන හේතුව වන අතර ප්‍රමාදය සඳහා අවිනිශ්චිත කාලගුණික තත්ත්වය ද බලපා ඇත. ඌව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සියළු කොන්ත්‍රාත් පැකේජ 2020 දෙසැම්බර් 31 වන විට සතුටුදායක ලෙස නිම කර තිබුණි. | වැඩ සැලැස්ම අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිම කිරීමට කටයුතු කළ යුතුය. ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කිරීමට නිර්දේශ කිරීමට පෙරාතුව ප්‍රමාදවීම් සඳහා හේතු හඳුනා ගැනීම කළ යුතුය. |
| 04 | විගණන වෙත ලබාදුන් තොරතුරු අනුව, 2020 දෙසැම්බර් 31 දින දක්වා රුපියල් මිලියන 7,090.90 ක් වටිනාකමැති කොන්ත්‍රාත් පැකේජ 153ක් කොන්ත්‍රාත්කරුවන්ට පිරිනමා තිබුණි. මේ අතුරින් රුපියල් | පවරන ලද කාර්යයන් නිම කිරීමට කොන්ත්‍රාත්කරුවන් අසමත්වීම්, කාර්යයන්ගේ ස්වභාවය සහ ජල ගැටළු පැවතීම් නිසාවෙන් ඉදිකිරීම් අපහසුවීම යනාදී විවිධ හේතු නිසා ක්‍රියාත්මක කිරීමේ ආයතන විසින් අක්‍රිය කොන්ත්‍රාත් පැකේජ ගණනාවත් නතර කරන ලදී. | අතිරේක කාලය සහ ශ්‍රමය වළක්වාලමින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| මිලියන 182.18ක් වටිනාකමැති කොන්ත්‍රාත් පැකේජ 03ක් විවිධ හේතු නිසාවෙන් නවතා තිබුණි. | සැළසුම් කළ අයුරින් වැඩ ඉටුකළ යුතු නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කිරීමෙන් පසු බොහොමයක් වැඩ යළි ඇස්තමේන්තු කිරීම හා නැවත පිරිනැමීම කර තිබුණි. අද වන විට, සෑම නැවත පිරිනැමීම් වැඩක්ම නිම කර තිබුණි. කොන්ත්‍රාත් නොන්දේසි අනුව වැඩ නිම කිරීමට අපොහොසත් වූ අදාළ කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව කටයුතු කරන ලදී. |

## 3.3 පද්ධති හා පාලනයන්

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය 2021දී නිම කිරීමට සැලසුම් කර ඇති නිසා ඉන්පසුව අදාළ අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපෑම් කරන බව විගණනයට නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම මත, වත්කම් අදාළ ආයතනවලට හිමිවන අතර ඔවුන් විසින් ඒවා නඩත්තු කරනු ලැබේ. එම ආයතනවල අවශ්‍යතාවය සඳහා එම වත්කම් සඵලදායීව යොදා ගන්නේ කෙසේද යන්න පිළිබඳ ව්‍යාපෘතිය විසිනුත් මාර්ගෝපදේශ සපයනු ලැබේ. | වත්කම්වල පැවැත්ම තහවුරු කළ යුතුය. |